**සී/ස ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (පෞද්ගලික) සමාගම - 2017**

---

සී/ස ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය (පෞද්ගලික) ('සමාගම') හා 2017 දෙසැම්බර් 31 දිනට සමාගමෙහි හා එහි පරිපාලිත සමාගමෙහි ('සමූහය')ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරන ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ('මණ්ඩලය') වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාර ධර්මවලට අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

----------------------------------

(අ) ලෙජර් ගිණුම් පැවැතුණද භාණ්ඩාගාර ප්‍රදාන, සම්බන්ධිත පාර්ශව සමග ගනුදෙනු, පෙර ගෙවුම්, ගෙවිය යුතු ගිණුම්, පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන හා ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සඳහා වූ රු.1,157,119,346 ක් ශේෂ පිරික්සුම හා මූල්‍ය ප්‍රකාශනවලට, අදාළ ලෙජර් ගිණුම්වල වාර්තා කිරීමෙන් තොරව සෘජුව ගළපා තිබුණි.

(ආ) සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 ජනවාරි 01 වන දිනට දේපළ, පිරියත හා උපකරණ හා අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය පිළිවෙලින් රු.2,140,197,281 ක් හා රු.5,528,113 ක් විය. කෙසේ වෙතත්, ස්ථාවර වත්කම් ලේඛනයක් හා විස්තරාත්මක උපලේඛන විගණනය වෙත ලැබී නොතිබුණි. ඒ අනුව, එවැනි ශේෂයන්හි නිරවද්‍යතාවය ලබා ගැනීමට විගණනයට නොහැකි විය. තවද, සමාලෝචිත වර්ෂය සඳහා දේපළ, පිරියත හා උපකරණ සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි.

(ඇ) සමාගමේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව, ක්ෂයවීම්, හීනවන ශේෂ ක්‍රමයට ගණනය කළ යුතු වේ. කෙසේ වෙතත්, ඊට පටහැනිව, සරල මාර්ග ක්‍රමයට ක්ෂය වීම් සිදුකර තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 63 වන ඡේදය අනුව, හානිකරණ අලාභ හඳුනා ගත යුතු වේ. කෙසේ වෙතත්, දේපල, පිරියත හා උපකරණ සඳහා සමාගම විසින් හානිකරණ පරීක්ෂණ සිදුකර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 19 හි 55 වන ඡේදයට පටහැනිව, සමාගම විසින් එහි සියලු සේවකයන්ගේ රු.39,149,400 ක් වූ විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම, මූල්‍ය වර්ෂයේ අවසාන මාසයෙහි, අර්ධ මාසික වැටුප මත පදනම්ව සිදුකර තිබුණි.

(ඊ) ප්‍රදාන ලැබීම් පිළිබඳ විස්තර විගණනය වෙත ලැබී නොතිබුණි. ඒ අනුව, 2017 දෙසැම්බර් 31 දිනට රු.295,976,497 ක් වූ ප්‍රදාන වත්කම් සඳහා වන විලම්භිත බැරකමෙහි හා රු.144,192,281 ක් ආදායම් ප්‍රකාශනයට මාරු කිරීමේ පදනමෙහි නිරවද්‍යතාවය සනාථ කරගැනීමට විගණනයට නොහැකි විය.

(උ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගම රු.1,635,436,951 ක ශුද්ධ අලාභයක් ලබා තිබුණි. ඒ අනුව, 2017 දෙසැම්බර් 31 දිනට සමාගමෙහි මුළු බැරකම් ප්‍රමාණය රු.1,855,406,085 කින් එහි මුළු වත්කම් ප්‍රමාණය ඉක්මවනු ලැබූ අතර, සමාගමේ ජංගම බැරකම් ප්‍රමාණය රු.1,816,256,715 කින් එහි ජංගම වත්කම් ප්‍රමාණය ඉක්මවනු ලැබුණි. මෙම සිද්ධීන්, සමාගමෙහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳව ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවත්නා බව පෙන්නුම් කරයි. සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන (හා ඒ සම්බන්ධ සටහන්) මෙම කරුණ, සැලසුම් කළමනාකරණය සිදුකර ඇති බව පිළිබඳ අවශ්‍ය හෙළිදරව් කිරීම් සමඟ හා වෙනත් අවාසිසහගත කරුණුවල පැවැත්ම, හෙළිදරව් නොකරයි.

**මතය ව්‍යාවනය**
**------------------**

මෙම වාර්තාවේ මතය ව්‍යාවනය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතය සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන සමාගමේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ නොකරමි.

**වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම**
**----------------------------------------------------------------------**

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියෙන් පෙන්වා දෙන පරිදි, පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය හා සීමාවන් ඉහත දැක්වෙන පරිදි වේ.

(ආ) මාගේ මතයට අනුව:
- විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට නොහැකි වූ අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන පරිදි, සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා නොතිබුණි.

- සමාගමෙහි හා සමූහයෙහි මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 හා 153 වගන්තිවල දැක්වෙන අවශ්‍යතාවයන් හා අනුකූල වේ.

(ඇ) 2007 අංක 07 දරන සමාගම් පනතෙහි 220 වගන්තිය ප්‍රකාරව, යම් සමාගමක ශුද්ධ වත්කම් ඒ සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් හරි අඩකට වඩා අඩු බව යම් අවස්ථාවකදී ඒ සමාගමේ අධ්‍යක්ෂවරයෙකුට පෙනී යන්නේ නම්, ඒ බව අධ්‍යක්ෂවරයාට දැනගැනීමට ලැබීමෙන් පසු වැඩකරන දින විස්සක් ඇතුළතදී, සමාගමට සිදුවී ඇති පාඩුවල ස්වභාවය සහ ප්‍රමාණය සඳහන් කරමින් සමාගමේ කොටස් හිමියන්ගේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් කැඳවීම සහ තවදුරටත් පැවැති අලාභ වළක්වා ගැනීමට හෝ සිදු වූ පාඩු පියවා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩලය පියවර ගත යුතුය. කෙසේ වුවත්, සමාගමේ ශුද්ධ වත්කම් ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් අඩකටත් වඩා අඩු වුවද සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙම අවශ්‍යතාවයට අනුකූල වීමට අපොහොසත් වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
**----------------**

සමාලෝචිත වර්ෂයේ සමාගමේ සහ සමූහයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය පිළිවෙලින් රු.1,635,436,951 ක හා රු.1,624,891,509 ක ඌනතාවයන් පෙන්නුම් කරන ලද අතර, ඉකුත් වර්ෂය සඳහා ඊට අනුරූපීව අතිරික්තය රු.11,271,579 ක් හා රු.14,169,209 ක් විය. වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු මුදල් රු.1,367,852,598 කින් වැඩිවීම මෙම ඌනතාවය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 2.2 අනුපාත විශ්ලේෂණය

සමාගමෙහි හා සමූහයෙහි ඉකුත් වර්ෂයේ ජංගම අනුපාතය පිළිවෙලින් 1:1.7 ක් හා 1:1.4 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේදී මෙම අනුපාතය 1:42 ක් හා 1:31 ක් විය.

## 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

**විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීමේ අවස්ථා පහත පරිදි වේ.**

| නීති, රීති, රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2003 අංක 27 දරන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනතෙහි 06 (2) වගන්තිය. | 2010 සිට 2012 දක්වා වූ වසර 03 ක කාල සීමාව සඳහා පළමු ඩිජිටල් රාජ්‍ය ප්‍රතිපත්ති සකස් කරන ලද අතර නැවත සකස් කිරීමේ/ සංශෝධනය කිරීමේ ක්‍රියාවලිය 2013 දී ආරම්භ කරන ලදි. කෙසේ වෙතත්, එය 2018 සැප්තැම්බර් 06 වන දින දක්වා සම්පූර්ණ කර ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ආ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 150 (1) වගන්තිය හා 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය. | මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වුවත්, සමාලෝචිත වර්ෂයේ වාර්ෂික මූල්‍ය ප්‍රකාශන, මාස දාසයක ප්‍රමාදයකින් පසු විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | |
| | (i) 5.1 වගන්තිය | චක්‍රලේඛය මගින් පෙන්වා දී ඇති පරිදි සමාගම විසින් සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි. |
| | (ii) 7.4.5 වගන්තිය | සමාලෝචිත වර්ෂය සඳහා පවත්වන ලද භාණ්ඩ සමීක්ෂණයේදී සමහර ජංගම නොවන වත්කම් ආවරණය වී නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව, එවැනි ජංගම නොවන වත්කම්වල පැවැත්ම විගණනයේදී අවිනිශ්චිත විය. |
| | (iii) 9.2 වගන්තිය | සමාගමේ සේවක අවශ්‍යතාවය හඳුනාගෙන නොතිබුණු අතර සමාගමේ දැනට සිටින සේවක සංඛ්‍යාව සඳහා වන අනුමැතිය රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොතිබුණි. තවද, බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සමාගම විසින් සකස් කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2006.

| | |
|---|---|
| (i) 2.8.4 වගන්තිය | ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවෙහි තාක්ෂණික ඇගයුම් කමිටු සඳහා ප්‍රසම්පාදනය පළපුරුදු, රේඛීය අමාත්‍යාංශයට හෝ ප්‍රසම්පාදන අස්ථිත්වයකට පරිබාහිර එක් සාමාජිකයෙකු හෝ පත් කළ යුතු වේ. කෙසේ වෙතත්, සමහර අවස්ථාවලදී සමාගම මෙම අවශ්‍යතාවය හා අනුකූල නොවී පැවතුණි. |
| (ii) 4.2.1 (ඇ) වගන්තිය | 2017 වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට සමාගම විසින් අසමත් වී තිබුණි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේදී රු.මිලියන 568.87 ක පිරිවැයකට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 77 ක භෞතික කාර්යසාධනය සෑහීමකට පත්විය හැකි මට්ටමේ නොවීය. මෙම ව්‍යාපෘතිවලින් ව්‍යාපෘති 07 ක් පමණක්, සමාලෝචිත වර්ෂයේ අවසානයට අපේක්ෂා කරන ලද පරිදි සියයට 100 ක භෞතික කාර්යසාධනයක් අත්පත් කරගෙන තිබූ අතර, ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට අපේක්ෂිත දිනට ව්‍යාපෘති 54 ක් සියයට 0 සිට සියයට 60 දක්වා භෞතික කාර්යසාධනයක් අත්පත් කරගෙන තිබුණි. තවද, පෙර වර්ෂයේ සම්පූර්ණ කිරීමට නියමිතව තිබූ ව්‍යාපෘති 13 ක් 2017 දෙසැම්බර් 31 වන විටත් සම්පූර්ණ කර නොතිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති සම්පූර්ණ කිරීම කඩිනම් කිරීම සඳහා සමාගම විසින් සෑහීමකට පත්විය හැකි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) පෙර වර්ෂවල වාර්තා වූ දුර්වල ව්‍යාපෘති කාර්යසාධනය පිළිබඳව නොසළකා හරිමින්, සමාගම වෙතට රු.මිලියන 15,000 ක පරිපූරක ප්‍රතිපාදනයක්, නව ව්‍යාපෘති 28 ක් ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හරහා ලබාදී තිබුණි. ඉහත ප්‍රතිපාදනයෙන්, සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 1,194.7 ක් සමාගම වෙත ලැබී තිබුණි. කෙසේ වෙතත්, මින්, සමාගමේ මෙහෙයුම් වියදම් සඳහා සමාගම විසින් රු.මිලියන 605.13 ක් වැය කර තිබුණි.

### 3.2 මතභේදයට තුඩුදුන් විෂයයන්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉ- ශ්‍රී ලංකා වැඩසටහනෙහි ප්‍රධාන දායකයා ලෝක බැංකුව බැවින්, 2003 ජූලි 16 වන දින කැබිනට් මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණය හරහා, සමාගම විසින් මූල්‍ය හා පරිපාලන අංශ සම්බන්ධයෙන් පූර්ණ ස්වාධීනත්වයක් අත්පත් කරගෙන තිබුණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය

දක්වා ඉහත තීරණය නොවෙනස්ව පැවතියද, වර්තමානයේදී සමාගම මුළුමනින්ම ඒකාබද්ධ අරමුදල මත රඳා පවතී.

(ආ) කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකුට ප්‍රදානය කරන ලද ඉ- සමෘද්ධි ව්‍යාපෘතියෙහි, පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණය (Customer Relationship Management) (CRM) හා මානව සම්පත් කළමනාකරණය යන ව්‍යාපෘතීන් සහ සහායක (HRM) හා නඩත්තු කටයුතු කොන්ත්‍රාත්තුව අදාළ කොන්ත්‍රාත්කරුවන්ට රු.මිලියන 3.98 ක ගෙවීමෙන් පසු 2017 සැප්තැම්බර් 14 වන දින සිට බලපැවැත්වෙන පරිදි කොන්ත්‍රාත් සමාගම විසින් අතරමග නතර කර තිබුණි.

(ඇ) ව්‍යාපෘති 03 ක් මෙහෙයවීම සඳහා බිල් හා මෙලින්ඩා ගේට් පදනමින් ලබාගෙන තිබුණු රු. මිලියන 130.5 න් බිල් හා මෙලින්ඩා ගේට්ස් පදනම සමඟ ඇති කරගත් ගිවිසුමේ කොන්දේසිවලට පටහැනිව රු.මිලියන 126.2 ක්, සමාගම විසින් වෙනත් මෙහෙයුම් වියදම් සඳහා යොදාගෙන තිබුණි.
තවද, ව්‍යාපෘති ගිවිසුම අනුව, ව්‍යාපෘති නිම කිරීමේ දිනය 2018 ජුනි 30 වන දින දක්වා දීර්ඝ කර තිබුණි. කෙසේ වෙතත්, 2018 ජුනි 30 වන දින වන විටත් ව්‍යාපෘති නිමකර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ගිවිසුමෙහි කාලසීමාව ඉකුත්වීමෙන් පසු, ඌන උපයෝජිත මුදල් බිල් හා මෙලින්ඩා ගේට්ස් පදනමට, සමාගම විසින්, ආපසු ලබාදිය යුතුව තිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

පෞද්ගලික ලිපිගොනුවල උප්පැන්න සහතික, ජාතික හැඳුනුම්පත්, අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්වල සහතිකපත්, පෙර සේවා පළපුරුද්ද හා සම්බන්ධ සේවා ලිපි, කාර්යසාධන ඇගයීම් දත්ත, රැකියා විස්තර හා රාජකාරී ලැයිස්තු ඇතුළත් නොවීම හේතුවෙන් සමාගමේ සේවකයන්ගේ පෞද්ගලික ලිපිගොනු අසම්පූර්ණව පැවතුණි.

## 4. තිරසාර සංවර්ධන ඉලක්ක අත්පත් කරගැනීම

වසර 2030 සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන ඉලක්කවලට අනුකූලව සෑම රාජ්‍ය ආයතනයක්ම ක්‍රියා කළ යුතුය. සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන්, මෙහි විෂය පථය යටතේ පවතින ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පියවර ගත යුතු ආකාරය පිළිබඳව සමාගම විසින් දැනුවත් වී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වසර 2030 සඳහා මෙම න්‍යාය පත්‍රය පිළිබඳව සමාගම විසින් දැනුවත් වීම තුළින්, සමාගම විසින්, සැමට, සියලු දෙනා ඇතුළත් හා ප්‍රමිතිගත අධ්‍යාපනයන් ලැබෙන බව තහවුරු කිරීම හා යාවජීව ඉගෙනීම ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනා ඇතුළත් තිරසාර ආර්ථික වර්ධනය, සේවා නියුක්තිය හා සෑහෙන තරම් වැඩ කටයුතු ප්‍රවර්ධනය කිරීම, නම්‍යශීලී යටිතල ව්‍යුහයක් ගොඩනැගීම, තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය හා නවෝත්පාදනය සඳහා ආධාර කිරීම, නගර සියලු දෙනාම ඇතුළත්, ආරක්ෂිත, නම්‍යශීලී හා තිරසාර බවට පත් කිරීම හා ඔවුන්ගේ විෂය පථය අනුව සාධාරණ, සාමකාමී හා සියලු දෙනා ඇතුළත් සමාජ අත්පත් කරගැනීම වැනි තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත්, වසර 2030 දක්වා ඉලක්ක හා අරමුණු හඳුනාගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති අතර 2018 හා 2019 වර්ෂ සඳහා පමණක් සමාගම විසින් ඉලක්ක හා අරමුණු අන්තර්ගත කර තිබුණි.

(ආ) 2017 ජුනි 01 වන දිනට පවතින මූලික දත්ත යොදා ගැනීම වෙනුවට, තිරසාර සංවර්ධන ඉලක්ක නම් කිරීම සඳහා 2018 අප්‍රේල් මාසයට පවතින මූලික දත්ත, 2017 ජුනි මස සිට යොදා ගෙන ඇත.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහ පාලනය

## 5.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ ප්‍රසම්පාදන කටයුතු 595 කින්, ප්‍රසම්පාදන කටයුතු 236 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී සම්පූර්ණ කර තිබුණි.

(ආ) රුපියල් මිලියන 50 ක ඇස්තමේන්තුගත පිරිවැයකින්, ඒකාබද්ධ ටිකට්පත් හා බිල්පත් නිකුත් කිරීමේ අවකාශය (Unified Ticketing and Billing Platform) (අයිසීටීඒ/ජීඕඑස්එල්/සීඕඑන්/කියුබීඑස්/2016/176) ක්‍රියාත්මක කිරීම සඳහා වන උපදේශන සේවා ප්‍රසම්පාදනය 2016 වර්ෂයේ අවසානයේදී ආරම්භ වී තිබුණි. කෙසේ වෙතත්, 2007 අගෝස්තු - උපදේශකයන් තෝරාගැනීම හා සේවයේ යෙදවීමේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.5.7(ආ) හා 8.4.1 වගන්ති ප්‍රකාරව, වලංගු කාලය තුල හෝ 2018 මාර්තු 27 වන දින වන විට හෝ තෝරාගත් උපදේශකයා වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා නොතිබුණි. තවද, යෝජිත වලංගු කාලය දීර්ඝ කිරීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) මිල ගණන් කැඳවීමෙහි (Invitation for Quotation) (IFQ) 07වන වගන්තිය ප්‍රකාරව, වයිරස් ප්‍රතිරෝධී බලපත්‍ර (Anti-virus license) ප්‍රසම්පාදන (අයිසීටීඒ/ජීඕඑස්එල්/ජීඕඕඩීඑස්/එන්සීබී/2016-69-ඒ) සඳහා ඉදිරිපත් වූ ලංසු ඇගයීමේදී ලංසුකරුවාගේ පෙර පළපුරුද්ද සැළකිල්ලට ගත යුතු වුවත්, තාක්ෂණික ඇගයුම් කමිටුව විසින්, තෝරාගත් ලංසුකරුවන්ගේ පෙර පලපුරුද්ද පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා ලංසුකරුවන් තෝරාගැනීමේදී මෙය අවශ්‍යතාවයක් ලෙස සැළකිල්ලට ගෙන නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා රජය විසින් 2018 වර්ෂයේදී මැඩ්රිඩ් පොට්‍රෝකෝල් සඳහා ප්‍රවේශවීමේ අරමුණින් ඉ-නිපෝ (e-NIPO) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පෙරාතුව පිහිටුවිය යුතු දෘඩාංග හා ජාලගත කිරීමේ උපකරණ ස්ථාපිත කිරීම හා නඩත්තු කිරීම සඳහා ප්‍රසම්පාදනයට සහාය දැක්වීම සඳහා සමාගම විසින් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (National Intellectual Property Office) (NIPO) සමඟ 2016 දෙසැම්බර් 30 වන දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. අවබෝධතා ගිවිසුමෙහි 3.3 වගන්තිය ප්‍රකාරව, ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය (NIPO) විසින් රු.මිලියන 32.5 ක්, සමාගමට ගෙවා තිබුණද, 2018 අප්‍රේල් 11 වන දින දක්වා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කර නොතිබුණි.

(ඉ) ඉ-සේවා (e-service), www.gov.lk හා ඉ-ආදායම් බලපත්‍රය (e- revenue license) වැනි සහායක හා නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තු 03 සඳහා තරඟකාරී තෝරාගැනීමේ ක්‍රමය (competitive selection method) අනුගමනය කිරීම වෙනුවට තනි ප්‍රභව තෝරාගැනීමේ ක්‍රමය (Single Source Selection method) (SSS) අනුගමනය කරමින් පිරිනමා තිබුණි. 2016 ජනවාරි 04 දින සමාගම තෝරාගත් කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුමකට එළඹ තිබුණද 2016 පෙබරවාරි 10 වන දින දක්වාත් ඇගයීම් කමිටුව විසින් යෝජනාව සඳහා ඉල්ලීම් කිරීමේ (Request for Proposal) ඇගයීම් වාර්තාව අවසන් කර නොතිබුණි. ඒ අනුව ප්‍රසම්පාදනයේ විනිවිදභාවය විගණනයට ප්‍රශ්නකාරී විය.

(ඊ) පළාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු සඳහා රු.598,050 ක් වටිනා ලැප්ටොප් පරිගණක ප්‍රසම්පාදනයේදී තෝරාගත් ලංසුකරු විසින් ලබාදෙන ලද 2016 දෙසැම්බර් 29 දිනැති

නිෂ්පාදකයාගේ බලය දීමේ ලිපිය අවශ්‍ය ආකෘතියට නොවූ අතර එහි ඇතුළත් වූයේ ඩෙල් නිෂ්පාදන පැවරීමේදී අනුගමනය කළ යුතු කොන්දේසි පමණි. ඒ අනුව, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.8.4 මාර්ගෝපදේශය ප්‍රකාරව මෙය ප්‍රධාන බැහැරවීමක් බව නිරීක්ෂණය විය.

(උ) ඉ-ආදායම් බලපත්‍ර (e-RL) දත්ත සංක්‍රමණය (අයිසීටීඒ/ජීඕඑස්එල්/සීඕඑන්/අයිසී/2016/77) හා ඉ-ආදායම් බලපත්‍රවල අලාභ ලැබීමේ ආදායම් වාර්තා (e-RC Loss Revenue Report) උත්පාදනය හා තීරණාත්මක වැඩිදියුණු කිරීම (අයිසීටීඒ/ජීඕඑස්එල්/සීඕඑන්/2016/174) ක්‍රියාත්මක කිරීම සඳහා තනි පුද්ගල උපදේශකයන් තෝරාගැනීම සඳහා වූ ප්‍රසම්පාදනය

(i) යෝජනා සකස් කිරීමේ කාලසීමාව තුළ, සමාගමේ ප්‍රසම්පාදන අංශය වෙත අනුයුක්ත කර තිබූ නිළධාරියෙකු විසින් සියළු යෝජනා ඊ-මේල් පණිවිඩ මගින් ලබාගෙන ව්‍යාපෘති කළමනාකරු වෙත ඉදිරිපත් කර තිබීම හේතුවෙන් ඉ- ආදායම් බලපත්‍ර (e-RL) දත්ත සංක්‍රමණය (අයිසීටීඒ/ජීඕඑස්එල්/සීඕඑන්/අයිසී/2016/77) හා ඉ-ආදායම් බලපත්‍රවල අලාභ ලැබීමේ ආදායම් වාර්තාව (e-RC Loss Revenue Report) උත්පාදනය හා තීරණාත්මක වැඩිදියුණුකිරීම ක්‍රියාත්මක කිරීම (අයිසීටීඒ/ජීඕඑස්එල්/සීඕඑන්/අයිසී/2016/77) සඳහා තනි පුද්ගල උපදේශකයන් තෝරාගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයේදී සමාගම විසින් අනුගමනය කරන ලද ප්‍රසම්පාදන ක්‍රියාවලිය විගණනයට ගැටළුකාරී විය.

(ii) ඉ-ආදායම් බලපත්‍ර දත්ත සංක්‍රමණය සඳහා තනි පුද්ගල උපදේශකයන් තෝරාගැනීමේ ප්‍රසම්පාදනය සඳහා වන කොන්ත්‍රාත්තුව 2016 දෙසැම්බර් 31 සිට 2017 අගෝස්තු 29 දින දක්වා අවස්ථා 03 කදී දීර්ඝ කර තිබූ අතර, ක්‍රමවත් වැඩ සැලැස්මක් ලබාගෙන නොතිබූ බැවින්, ඉ-ආදායම් බලපත්‍ර අලාභ ලැබීමේ ආදායම් වාර්තාව උත්පාදනය හා තීරණාත්මක වැඩිදියුණු කිරීම ක්‍රියාත්මක කිරීමේ කොන්ත්‍රාත්තුව 2017 ඔක්තෝබර් 19 දක්වා මාස 04 කින් දීර්ඝ කර තිබුණි.

6. පද්ධති හා පාලනයන්
-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | වත්කම් කළමනාකරණය | වටිනාකම් ආගණනය, ලේඛනගත කිරීම, අයිතිය මාරු කිරීම හා දේපල, පිරියත හා උපකරණ ආරක්ෂා කිරීම හා සම්පත් භාවිතා කිරීමට අදාල කටයුතු සිදුකර නොතිබුණි. |
| (ආ) | මූල්‍ය කළමනාකරණය | කාර්යක්ෂම මූල්‍ය කළමනාකරණ ක්‍රමෝපායයන් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදනය | ප්‍රසම්පාදන ලිපිගොනු සෑහීමකට පත්විය හැකි ආකාරයෙන් පවත්වා නොතිබුණි. |
| (ඈ) | අයවැය | ප්‍රාග්ධන වියදම් සඳහා සලසා ඇති ප්‍රතිපාදන වැටුප් ගෙවීම සඳහා භාවිතා කර තිබුණි. |